# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2498/76 - 2026 ජූලි මස 24 වැනි සිකුරාදා - 2026.07.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ජනාධිපති නීතිඥවරුන් පත් කිරීම සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ

ජනා.කා. අංකය: පීඑස්/සීඑස්ඒ/00/2/48 - Vol III

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33(ඉ) ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් ජනාධිපති නීතිඥවරුන් පත්කිරීමේදී අදාල වන අංක 2255/24 දරන 2021 නොවැම්බර් මස 24 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද මාර්ගෝපදේශයන් පහත පරිදි සංශෝධනය කිරීමට ගරු ජනාධිපතිතුමා නියම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**ආචාර්ය එන්. එස්. කුමානායක,**
ජනාධිපති ලේකම්.

2026 ජූලි මස 24 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

### ජනාධිපති නීතිඥයන් පත් කිරීම සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ සංශෝධනය

01. අංක 2255/24 දරන 2021 නොවැම්බර් මස 24 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ජනාධිපති නීතිඥයන් පත්කිරීමට අදාල මාර්ගෝපදේශයන්හි අංක 04 ඉවත් කර පහත වගන්තිය ආදේශ කරනු ලැබේ.

> "04. ඔහු / ඇය අවම වශයෙන් වසර විස්සක (20) කාලයක් තුළ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරයෙකු වශයෙන් කටයුතු කර නොමැතිනම් ජනාධිපති නීතිඥයෙකු වශයෙන් පත් නොකළ යුතුය."

EOG 07 - 0370


1A - G 47380 — 04 (2026/07)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*